**බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය,වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දුරකථන කුළුණකින් හා සංදර්ශන ප්‍රවේශ පත්‍රවලින් ලද රු.160,200ක් තැන්පතු ලෙස ගිණුම්ගත කර තිබුණි. | ආදායමට ගැනීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. |
| (ආ) | ප්‍රාදේශීය සභා ගිණුම් සංග්‍රහය අනුව මාර්ග ගිණුම්ගත කිරීම සිදු නොකළද රු.123,795,437 ක් වූ මාර්ග ගිණුම්ගත කර තිබුණි. | මධ්‍යම රජය හා පළාත් සභාව මඟින් කර්මාන්තය නම් කළ පසු මාර්ගය සංවර්ධනය කරන බව හා එහිදී අදාළ පාර සභාව සතු ද යන්න සොයා නොබලන බව. | - එම - |
| (ඇ) | වටිනාකම රු.800,000 ක් වූ බේලර් යන්ත්‍රයක් හා ලැබිය යුතු කුළී රු.10,060ක් ගිණුම් ගතකර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී ඇතුළත් කරන බව | - එම - |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට අනුව ගිණුම් විෂයයන් 08ක 2022 දෙසැම්බර් 31 දිනට පැවැති ශේෂය, ඊට අදාළ උපයෝගී ලේඛනවල එදිනට පැවැති ශේෂය හා සැසඳීමේ දී රු.99,805ක වෙනසක් පැවැතුණි. | වෙනස් වීම් සොයා බලා නිවැරදි කර න බව | මූල්‍ය ප්‍රකාශනවල අගයන්, උපයෝගී ලේඛන සමග සැසඳිය හැකි විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,854,628 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 872,922ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| ------- | -------- | ------- | --------- | ----------- | --------- | ---------- | --------- | -------- |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,851,150 | 1,937,458 | 1,978,800 | 152,753 | 1,736,000 | 1,754,219 | 1,662,621 | 223,738 |
| කුලී | 6,202,500 | 2,089,923 | 2,089,923 | 523,465 | 2,804,800 | 1,827,873 | 1,836,773 | 523,465 |
| බලපත්‍ර ගාස්තු | 386,200 | 303,900 | 303,900 | - | 410,200 | 393,760 | 380,860 | |
| වෙනත් ආදායම් | 3,851,650 | 2,427,747 | 2,480,947 | - | 3,001,400 | 2,837,216 | 2,791,430 | 37,580 |
| | **12,291,500** | **6,759,028** | **6,853,570** | **676,218** | **7,952,400** | **6,813,068** | **6,671,684** | **784,783** |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------- | --------------- |
| (අ) | වරිපනම්, අක්කර බදු හා කඩ කුලී යන ආදායම් විෂයයන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.630,612ක් අයවිය යුතුව තිබුණි. එම වටිනාකම තුළ වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක් පැරණි රු.523.465ක ශේෂයක් පැවැතිණි. | හිගහිටි මුදල් ඉදිරියේදී අය කරන බව. | හිග ආදායම් නොපමාව අයකළ යුතු වේ. |
| (ආ) | රජයේ තක්සේරුවට අනනුකූලව සභා තීරණයක් මත කඩ කාමරවලින් කුලී අයකිරීම නිසා 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රු. 2,388,750ක කුලී ආදායමක් අහිමි වී තිබුණි. | දක්වා ඇති තොරතුරු නිවැරදි බව. | සභාවට අහිමි වූ ආදායම වගකිව යුතු අයගෙන් අයකළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------------------- | --------------- |
| (අ) | ඉකුත් වර්ෂවල දී කොරෝනා වසංගතය වෙනුවෙන් ලද ආධාර රු.300,000ක් එම කාර්යයට නොයොදවා තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | මේ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය අතපසුවීමකින් වැය ශීර්ෂ යටතේ මිළ දී ගෙන තිබුණි. එය 2023 වර්ෂයේ දී නිවැරදි කරන බව. | අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතුවේ. |
| (ආ) | රු. 624,554ක් වූ කර්මාන්ත ණයගැති ශේෂ වර්ෂ 01ත් වර්ෂ 03ත් අතර කාලයක් පැරණි වූ අතර වර්ෂ 01ත් වර්ෂ 04ත් අතර කාලයක් පැරණි රු.87,200ක ණයහිමි ශේෂයක් පැවැතුණි. | කොටසක් මේ වන විට ලැබී ඇති බව හා ගෙවිය යුතු ශේෂයෙන් කොටසක් නිරවුල් කර ඇති බව. | ණයගැති ණයහිමි ශේෂ යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතු වේ. |

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| හාතාගොඩ, පන්නල පූනැහැල ඔය හරහා දමා තිබූ පැරණි යකඩ පාලම ගලවා ඉවත්කිරීමේ දී එහි වූ යකඩ කොටස් සම්බන්ධයෙන් තොරතුරු සැපයීමට සභාව අපොහොසත් විය. | මේ සම්බන්ධව ප්‍රාදේශීය සභාව සතුව ලිපි ගොනුවක් නොමැති බව. | මේ සම්බන්ධයෙන් විමර්ශනයක් කළ යුතු වේ. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2019 වර්ෂයේදී සභාවට ලද රු.6,221,373 ක් වූ කම්පැක්ටරය ලද දින සිට නිෂ්කාර්යව පැවතුණි. | මෙම යන්ත්‍රය ගොඩකවෙල ප්‍රාදේශීය සභාවට භාර දීමට නියමිත බව. | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතු වේ. |
| (ආ) | සභාව සතු රු. 5,045,318 ක් වූ වාහන 03ක් වසර 02ත් 05ත් අතර කාලයක සිට අක්‍රියව පවතී. | සභාවේ මූල්‍ය තත්ත්වය අයහපත් නිසා මෙම වාහන අලුත්වැඩියාව ප්‍රමාද වී ඇති බව. | අප්‍රමාදව අලුත්වැඩියාව කළ යුතු වේ. |
| (ඇ) | සභාව භාවිතා කරන රු.20,551,373ක් වූ වාහන 10 ක් හා රු. 523,000 ක් වූ ට්‍රේලර් 02 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පැවති මූල්‍ය අර්බුදය හමුවේ පවරා ගැනීමේ කටයුතු ප්‍රමාද වූ අතර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ වාහනවල අයිතිය පවරා දීමට කටයුතු කරන බව ලිඛිතව දන්වා ඇති බව. | නොපමාව පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | වාහන 02ක් වර්ෂ 02 කට වැඩි කාලයක සිට අභාවිතව පැවැති අතර, ට්‍රැක්ටර් 02ක් ඌන උපයෝජිතව පැවැතුණි. | වාහන ඵලදායී යෙදවීමට කටයුතු කරන බව. | වත්කම අභාවිතව නොතැබිය යුතු වේ. |